# උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය

## උපදේශාත්මක ගීත

ගුවන් විදුලිය, රූපවාහිනීය, ඒ වගේම නව මාධ්‍ය හරහා අපට ඇසෙන විවිධ ගීත අතර තවත් එක් ගීත විශේෂයකි උපදේශාත්මක ගීත. ගීතයක පද මාලව තුලින්, යම්කිසි පණිවුඩයක් නැතහොත් උපදේශයක් ලබා දෙන්නේ නම් එම ගීත මෙම උපදේශාත්මක ගීත නමින් හඳුන්වයි. සමාජයීය වටිනාකම්, සංස්කෘතිකමය චාරිත්‍ර වාරිත්‍ර , ජාතික හා ආගමික වටිනාකම් සහිත උපදේශ , උපහැරණ මෙම ගීත වල පද මාලාවෙන් විද්‍යාමාන වේ. එසේම මෙම ගීත ශ්‍රවණයෙන් යමෙකු ආකල්පමය හා චර්යාමය වශයෙන් යහපත් වෙනසකට ලක්වේ.

## අප අතර ප්‍රචලිත උපදේශාත්මක ගීත කිහිපයක්.

නොමග නොයන් පුතේ
අහන්න මගෙ හොඳ පුංචි පුතේ

දූ පුතුනේ රට අපේය

කරුණාව සමඟ හොඳ හිත පතුරන්න හැම කෙරේ

දැඩිකළ මාතා පෙම්බර මාතා

මව්පියො ආදී සොඳුරුතමාගේ

හිතන්නකෝ අයියේ

සමන් වැලේ මල් ජයට පිපීලා

පාන්කිරිත්තා තක්කිට තරිකිට

**පහතින් දක්වා ඇති ගීතය අන්තර්ජාලයෙන් සොයාගෙන සවන් දෙන්න.**

## නොමග නොයන් පුතේ.

පුනගැයුම

නොමඟ නොයන් පුතේ ඔබට රටක් ඇතේ
රටේ දියුණ සැදුම නුඹට බාර යි මගෙ පුතේ
බාර යි මගෙ පුතේ

අන්තරා 1කොටස

යෝධ මහල් නැහැ කවදත් එක දවසින් තැනුණේ
ගඩොළින් ගඩොළක් තබලා සෙමින් සෙමින් බැඳුණේ
සෙමින් සෙමින් බැඳුණේ
දුර නොබලා ඉක්මන් වී නෑ නෑ පල ලැබුණේ
යන්නෙ කොහේ දැයි නොම දැන
නොයන් ගමන් පුතුනේ

අන්තරා 2කොටස

අද කැඩූ දේ හෙට ඕනෑ විය හැකි වන නිසා
රටට උරුම කිසි ම දෙයක් බිම නොදමන් නසා
බිම නොදමන් නසා
තරුණ සවිය රට නැගුමට යොදනු හොඳින් සිතා
ඔබේ උපන් බිම කවදත් ඔබට යි මගෙ පුතා

ඔබට යි මගෙ පුතා

පද රචනය- ජෝර්ජ් ලෙස්ලි රණසිංහ
තනු - ආචාර්ය දයාරත්න රණතුංග
ගායනය- විල්බට් ඇන්තනි


ශ්‍රී ලංකාව ඔබගේත් මගේත් මවයි. අපගේ රට පිළිබඳ අපගේ සිත් තුල වැඩිය යුතු අදහසක් නැතහොත් ආකල්පයක් පිළිබඳ මෙම ගීතයෙ පද පෙළින් මතු කර දක්වයි. රටක සංවර්ධනය තීරණය වන්නේ එහි ජීවත්වන පුරවැසියන්ගේ චර්යාවන් හා ආකල්ප මතිනි. වැරදි චර්යාවන් හා වැරදි ආකල්ප නිසා පුද්ගලයන්ගේ ජීවිත අඳුරු වේ. මේ කාරණය වටහා ගෙන රටේ දියුණුව වෙනුවෙන් නිවැරදි මග ගමන් කරන්නට පියෙකු හෝ වැඩිහිටියෙකු හෝ කරන ආරාධනයක් ගීතයේ පුන ගැයුමෙන් ප්‍රකාශ වේ.

රටේ දියුණුව එනම් සංවර්ධනය සඳහා පුරවැසියෙක් ලෙස ඉවසිලිවන්තබව, නොපසුබටඋත්සහය, මානසික ශක්තිමත් බව, දූරදර්ශීබව, විචක්ෂණශීලී බව සමග බුද්ධිමත්බව ආදී ගුණාංග වර්ධනය කරගැනීම අත්‍යවශ්‍ය බව විවිධ උදාහරණ මගින් ගීතයේ පියා සිය පුත්‍රයා වෙත ගෙනහැර දක්වයි. එසේම රටක සංවර්ධනයට දායක වීමේ දී සකසුරුවම්බව එනම් සම්පත් පරිහරණයේ දී පරිස්සමින් අවශ්‍ය ප්‍රමාණය පමණක් පරිහරණයේ වැදගත්කම ගීතයේ දෙවන අන්තරා කොටසින් රචකයා අවධානයට ලක්කරයි. ස්වාභාවික සම්පතක් වේවා ආර්ථික වටිනාකමක් ඇති හෝ නැති ඕනෑම වස්තුවක්, සම්පතක් අප ඉතාමත් පරිස්සමින් අනාගතය ගැන සිතමින් භාවිතා කළයුතු බව ඉන් පැහැදිලි කෙරේ.

මෙසේ සමාජයීය වශයෙන් ඉතා වැදගත් අදහස්, උපදෙස් , අනුශාසනා සහිත පද මාලාවක් උපදේශාත්මක ගීතයක අනිවාර්ය ලක්ෂණයකි. ගීතයේ අර්ථය හා මාතෘකාවට ගැලපෙන පරිදි සරළ භාෂාවක් හෝ ගැඹුරු භාෂාවක් පද රචකයාගේ කැමැත්ත අනුව භාවිතා වේ. මෙම ගීතයේ සේම ගීතයේ අදහස මතු කිරීමට අදහසට ගැලපෙන හා රසිකයා පිනවන හැකි නාදමාලවක් හෙවත් තනුවක් සෑම උපදේශාත්මක ගීතයම දක්නට ඇත. ගීතය වඩාත් රසවත් සහ රසිකයා අතර ජනප්‍රියවන්නට ගීතය ගායනා කරන ගායකයාගේ කට හඬ ද හේතුවක් වේ.

මෙලෙස ඔබ ශ්‍රවණය කරන සෑම උපදේශාත්මක ගීතයකම හරය හා රසය පිළිබඳ වෙන වෙනම සොයා බැලිය හැක. මෙම පාඩමෙන් ඔබව යොමුකරන්නේ ද ඒ වෙනුවෙනි. ගීතය අසා රසවිඳ එය අමතක කර දැමීම නොව ගීත අසා රසවිඳ එහි අදහස හා හරය පිලිබඳ සොයා බලා එයින් මතුවන උපදේශය සිය ජීවිතයට එක්කර ගැනීමට අප පුහුණු විය යුතුය. ඉහළ රසවින්දනයක් සහිත පරිපූර්ණ මිනිසෙකු බිහිවීමට උපදේශාත්මක ගීය සමාජයීය වශයෙන් විශාල කාර්යභාරයක් සිදුකරයි.

## නොමග නොයන් පුතේ C Major $\frac{6}{8}$




**තවත් උපදේශාත්මක ගීත කිහිපයක පද මාලාව හා තනුව පහතින් දැක්වේ. දොමාපියන්ගේ අනුදැනුම මත අන්තර් ජාලය ඇසුරු කරගනිමින් එම ගීත වලට සවන් දෙන්නට ඔබට උත්සහ කරන්න. එසේම ඒ සමග ඔබත් ගායනය කර පුහුණු වන්න. ලබා දී ඇති ස්වර ප්‍රස්තාර කියවා ඔබේ සංගීත භාණ්ඩය වාදනය කිරීමට ද උත්සහ කරන්න.**

# අහන්න මගෙ හොඳ පුංචි පුතේ

අහන්න මගෙ හොඳ පුංචි පුතේ ඔබේ අතේ මතු අනාගතේ
වැදූ මවත් ඔබ දිනූ බිමත් රැක ගන්න ඔබේ ඇස් දෙක වාගේ
එපා නමන්නට අයුක්තියට හිස
යුතුකම සුරකිනු පණ වාගේ


ඔබෙ නම පතළ ව මහ වියතකු වී
තිබුණත් වස්තුව පිරී තිරී
ලෝකයෙ ඔබ කොයි මුල්ලක සිටියත්
මැරෙන්න ලක් දිව දෙසට හැරී

පද රචනය-
තනු රචනය-
ගායනය-ජේ.ඒ මිල්ටන් පෙරේරා

## අහන්න මගෙ හොඳ පුංචි පුතේ F Major $\frac{4}{4}$

Intro

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Vio | ධ | – | ධ | ධ | ධ | ධ | නි | ස් | නි | – | ප | නි | ප | – | ම | ධ | |
| Vio | ප | – | ස | රි | ග | – | – | – | + | සගු | මප | නිප | ගු | ස | ම | ගු | |
| | | | | | | | | | | Mandolin | | | | | | | |
| Flu | ප | ම | ධ | ප | නි | ධ | ප | ගු | ම | – | – | – | + | ධ | ප | ග | ම |
| | | | | | | | | | | | | | | Mandolin | | | |
| Chorus | [ ධ | ධ | ස් | නි | ධ | ධ | ප | ම | – | ම | ම | ප | ධ | – | ප | ම | |
| | – | රි | රි | ගු | ම | නි | නි | ධ | ධ | පප | ප | ම | ම | පම | ගු | රි | |
| | | | | | + | ධ | ප | ගු | ම | | | | | | | | |
| | – | රි | රි | ගු | ම | නි | නි | ධ | ධ | පධ | ප | ම | ම | – | – | – ] | |
| | | | | | | | | | | | | Inter | + | + | ධ | නි | |
| | ස් | – | – | – | රි̇ | –ස් | – | නි | ස් | – | – | – | – | – | ග | ම | |
| | ප | – | – | – | නි | –ධ | – | ධු | ධ | – | – | – | – | – | නි | ස් | |
| | නි | – | ප | නි | ධ | – | ම | ධ | ප | – | ස | රි | ග | – | – | – | |
| | | | | | | | | | | | | | + | සග | මප | නිප | |
| | | | | | | | | | | | | | | Mandolin | | | |
| | ගු | ස | ම | ගු | ප | ම | ධ | ප | නි | ධ | ප | ගු | ම | – | – | – | |
| | | | | | | | | | | | | | + | ම | ප | නි | ස් |
| | | | | | | | | | | | | | | Mandolin | | | |




දූ පුතුනේ රට අපේය

දූ පුතුනේ රට අපේ ය- දූ පුතුනේ අප රටේ ය

මල් කැන් සුවඳ දෙයි ගල් කණුවල පිපුණු
ලේ දහදිය නටයි රණ දෙරණේ හැළුණු
ජාතිය නඟන රිසියෙන් හද ඔද වැඩුණු
එනු  ඉදිරියට පුත පැරකුම් දුටුගැමුණු

සමනොළ ගිරග ඉර හඳ සැතපෙන තුරු ම
රට වට මුහුද නිසල ව නිදියන තුරු ම
පුලතිසි පිළිමයට යළි පණ එන තුරු ම
මේ සිරිලක් මඬල පුත අපට යි උරුම

ගේය පද- තිලකරත්න කුරුවිට බණ්ඩාර
සංගීතය- ජූඩ් පීරිස්
ගායනය- ශාලිත අබේවික්‍රම

# දූ පුතුනේ රට අපේය F Major

Intro-Inter

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| [ | ස̇ස̇ස̇ස̇ | රිම- | මමමම | මරි- | නිනිනිනි | සරි- | රිරිරිරි | රිස- |

Cho (segno)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ස-ස | රිම- | මමම | ම-රි | නි-නි | සරි- | රිරිරි | රි-ස | ] |

Inter

Verse

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සම | ම | ම | මප | ධ | ධ | ධ | ධ | ධ | ප | ම | |
| ග | ම | පධ | ප | ප | - | +ම | පධ | නිස̇ | රි̇ | ග̇ | ම̇ | ප+ Bit |
| + | සග | ග | ග | ග | ම | ප | - | ප | ප | නි | ධ | |
| පධ | ප | ම | ම | ම | - | +ස | රිග | මප | ධ | නි | ස̇ | රි̇+ Bit |
| + | නිරි | රි | රි | රි | රි | රි | රි | රි | ම | ග | රි | |
| නි | ස | රි | ස | ස | - | +ග | මප | ධනි | ස̇ | රි̇ | ම̇ | ග̇+ Bit |
| + | සග | ග | ග | ග | ම | ප | ප | ප | ප | නි | ධ | |
| පධ | ප | ම | ම | ම | - | රිග | මප | ධනි | ස̇+ | රි̇+ | ම̇+ | (segno) |

Bit

**උපදේශාත්මක ගී ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. උපදේශාත්මක ගීත වල විශේෂ ලක්ෂණ මොනවාද?

2. දෙමාපියන්ගේ උපකාරය ගෙන අන්තර්ජාලය ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ගීතය | ගායකයා හෝ ගායිකාව |
|---|---|
| නොමග නොයන් පුතේ | |
| දූ පුතුනේ රට අපේය | |
| කරුණාව සමග හොඳ හිත | |
| මව්පියො ආදී සොඳුරුතමාගේ | |
| හිතන්නකෝ අයියේ | |
| පියුමෙහි පැණිබොති | |
| පාන් කිරිත්තා තක්කිට තරිකිට | |
| දැඩිකළ මාතා | |
| සමන්වැලේ මල් ජයට පිපීලා | |

3. ඔබ කැමති උපදේශාත්මක ගීතයක් තෝරාගෙන එහි අදහස සරළව, ඔබේ වචනයෙන් විස්තර කරන්න.

4. වත්මන් සමාජ තත්වය ගැන සිතා , ළමයෙකු වශයෙන් ඔබට පැවරෙන වගකීම් පිළිබඳ කියවෙන උපදේශාත්මක ගීතයක් නිර්මාණය කරන්න.

5. සමාජය තුල ප්‍රචලිත උපදේශාත්මක ගීත අඩංගු පොත් පිංචක් නිර්මාණය කරන්න.